www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10
ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 10 ශ්‍රේණිය | නර්තනය | ඒකකය : 13 |
| --- | --- | --- |

## වේදිකා නාට්‍ය ගීතයට නර්තන නිර්මාණය (ප්‍රායෝගික)

- **ප්‍රශ්න අංක 01 සිට 13 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) නිර්මාණය රකිමින් නැටීමේ නිදහස වැඩියෙන්ම ඇත්තේ,
1) ගීතයකට නැටීමේදී ය. 2) කස්තිරම් නැටීමේදී ය.
3) අඩව් නැටීමේදී ය. 4) වන්නම් නැටීමේදී ය.

(2) ගීතයකට අනුව චලන නිර්මාණය කිරීමේ දී,
1) නිදහස් චලන භාවිත කළ යුතුය.
2) සාම්ප්‍රදායික චලන භාවිත කළ යුතුය.
3) ගීතයෙහි අරුත චලනයෙන් ප්‍රකාශ විය යුතුය.
4) ගීතයට අනුව භාවිත චලන ඖචිත්ත බවකින් යුක්ත විය යුතුය.

(3) හනික වරෙව් කොල්ලනේ............. / මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ ................... මෙම ගීත,
1) ටෙලි නාට්‍ය ගීත වේ. 2) චිත්‍රපට ගීත වේ.
3) වේදිකා නාට්‍ය ගීත වේ. 4) ගුවන් විදුලි නාට්‍ය ගීත වේ.

(4) 'බෙර හඬ' නාට්‍යයේ අධ්‍යක්ෂවරයා කවුද?
1) බන්දුල ගුණවර්ධන 2) බන්දුල ජයවර්ධන
3) හෙන්රි ජයසේන 4) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

(5) 'හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්' නමැති නාට්‍ය ගීතය ඇතුළත් නාට්‍යයේ නම කුමක් ද?
1) හුණුවටයේ කතාව 2) බෙර හඬ
3) විදුර 4) සිංහබාහු

(6) බෙර හඬ නාට්‍යයේ මුල් කෘතිය කුමක් ද?
1) ඉක්නෙවුටා ඉ 2) ප්‍රොමිතියස් බවුන්ඩ්
3) ඊඩිපස් රජ 4) ඇන්ටිගනී

(7) බෙර හඬ නාට්‍යයේ මුල් කෘතියේ රචකයා කවු ද?
1) ශ්‍රී හර්ෂ දේව 2) සොෆොක්ලීස්
3) සෙඅමි මොතොකියො 4) ශේක්ස්පියර්

(8) බෙර හඬ නාට්‍යයේ මුල් කෘතිය කුමන වර්ගයකට අයත් වේ ද?
1) ශෝකජනක 2) සුඛජනක
3) ඓතිහාසික 4) සැටර් (සටුර)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(9) බෙර හඬ නාට්‍යයේ මුල් කෘතිය කුමන රටකට අයත් ද?
1) ග්‍රීසිය 2) එංගලන්තය
3) ඉන්දියාව 4) ජපානය

(10) නීතිඥ චාල්ස් ඩයස් අමරතුංගයන් ගේ 'විදුර' නාට්‍යයේ එන ගීතයකි,
1) මඩේ ලගින තාරාවන් නාවන්නද මං 2) සෝබාව දේ මෙපුර
3) මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ 4) දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්දා

(11) 'මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ .............' නමැති ගීතය ඇතුළත් නාට්‍ය කුමක් ද?
1) සිරිසඟබෝ 2) දුටුගැමුණු
3) වෙස්සන්තර 4) විදුර

(12) 'මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ .............' නමැති ගීතය ඇතුළත් නාට්‍යයේ රචකයා කවුද?
1) නීතිඥ ජෝන් ද සිල්වා 2) නීතිඥ චාල්ස් ඩයස්
3) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර 4) හෙන්රි ජයසේන

(13) 'මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ .............' ගීතය කුමන වර්ගයට අයත් ගීතයක් ද?
1) නාඩගම් ගීතයකි. 2) නූර්ති ගීතයකි.
3) ටවර්හෝල් ගීතයකි. 4) නව නාට්‍ය ගීතයකි.

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(14) 'හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව් ..........' නමැති නාට්‍ය ගීතය සම්පූර්ණයෙන් ලියන්න.

(15) ඉහත ගීතයේ අදහස සරලව ලියා දක්වන්න.

(16) 'මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ .........' නමැති නාට්‍ය ගීතය සම්පූර්ණයෙන් ලියන්න.

(17) ඉහත ගීතයේ අදහස සරලව ලියා දක්වන්න.

(18) වේදිකා නාට්‍ය ගීතයකට නර්තන නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න.

(19) ගීතයට අනුව නර්තන නිර්මාණය නමැති සාමුහික ක්‍රියාකාරකමේ දී වර්ධනය කර ගත හැකි කුසලතා 03 ක් ලියන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk